# කොළඹ මහා නගර සභා බෞද්ධ වැඩසටහන - 2018

2018 අප්‍රේල් මස 26 වැනි දින සිට මැයි මස 2 වැනි දින දක්වා ජාතික වෙසක් සතිය ලෙස රජය මගින් ප්‍රකාශ කර තිබූ අතර වෙසක් සතියට සමගාමීව කොළඹ මහා නගර සභාව මගින් කොළඹ නගරය කේන්ද්‍ර කර ගනිමින් උත්කර්ෂවත් ලෙස මෙවර වෙසක් උත්සවය පැවැත්වීමට ගරු නගරාධිපතිනිය තීරණය කර තිබුණි.

මෙම වැඩසටහනේ අංග පහත සඳහන් පරිදි වේ.

01. 2018.04.25 වන දින පිණ්ඩපාත වැඩසටහන ගරු ස්වාමීන් වහන්සේලා 150 නමක් සහභාගී කරවා ගැනීම සහ එදින සවස ගරුතර ස්වාමීන් වහන්සේලා 150 නමක් සහභාගී වන භාවනා වැඩ සටහනක් පැවැත්වීම.

02. 2018.04.29 වන දින නගර ශාලාව තුළ උදෑසන 7.00 සිට සවස 5.00 දක්වා සීල භාවනා වැඩසටහන පැවැත්වීම සහ ප.ව. 6.30 ට පහන් පූජාවක් විහාර මහා දේවී උද්‍යානයේ බුදු පිළිමය ඉදිරිපිට පැවැත්වීම.

03. දහම් පාසල් අතර භක්ති ගීත ගායනා තරඟයක්, පාසල් අතර භක්ති ගීත ගායනා තරඟයක්, පාසල් අතර වෙසක් කූඩු තරඟයක්, කොළඹ මහා නගර සභාවේ දෙපාර්තමේන්තු අතර වෙසක් කූඩු තරඟයක්, නගර සභා සේවකයින් සහභාගී වන භක්ති ගීත ගායනයක් හා කලාකරුවන්ගේ සහභාගීත්වයෙන් නගර සභා පරිශ්‍රයේදී නූර්ති ගී ගායනා කිරීම.

04. එෆ්.ආර්.සේනානායක මාවත හා කොළඹ මහා නගර සභා ගොඩනැගිල්ල විදුලි ආලෝක කිරීම.

05. පහන් ආලෝකයෙන් ආලෝකමත් නොවූ වීදි පහන් ආලෝකමත් කිරීම.

06. සිද්ධාර්ත ගෞතම චිත්‍රපටය ප්‍රදර්ශනය කිරීම.